## සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමේ නව උපායමාර්ගයන්

රටෙහි පවතින ආර්ථික හා මූල්‍ය අස්ථාවරත්වය හමුවේ විවිධ හේතූන් මත සංවර්ධන ව්‍යාපෘතිවල කාර්යසාධනයෙහි සැලකිය යුතු පසුබෑමක් පවතින බව 2022 වර්ෂය තුල දී වාර්තා වී ඇත. මෙම තත්ත්වය යටතේ රජයේ ප්‍රමුඛතාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ මහජනතාවට ලබා දීම ප්‍රමාදවීම ප්‍රධාන ගැටළුවක් වී ඇති බැවින් සංවර්ධන ව්‍යාපෘතිවල ගැටළු කඩිනමින් නිරාකරණය කරමින් සුමට ක්‍රියාකාරීත්වයක් තහවුරු කිරීමේ නව උපායමාර්ගයක අවශ්‍යතාවය කෙරෙහි රජයේ අවධානය යොමු විය. ඒ අනුව, 2022.09.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා වේගවත් කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත ***"මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP)"*** කමිටුව පත් කරන ලදී.

| | | |
|---|---|---|
| I. | අනුර දිසානායක මහතා, අග්‍රාමාත්‍ය ලේකම් | සභාපති |
| II. | වසන්තා පෙරේරා මිය, ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සාමාජික |
| III. | ඩබ් ඒ. සරත් කුමාර මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | සාමාජික |
| IV. | ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන මහතා, ජනාධිපති අතිරේක ලේකම් | සාමාජික |
| V. | අජිත් අබේසේකර මහතා, අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | සාමාජික |
| VI. | අයන්ති ද සිල්වා මිය, අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | ලේකම්/කැඳවුම්කරු |

රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 260 ක් පවතින අතර ඒවායෙහි සුමට ක්‍රියාකාරීත්වයට බලපාන ගැටළුවලට විසඳුම් හා ඉදිරි ක්‍රියාකාරීත්වය පිළිබඳ උපදෙස් ලබා දීම මෙම කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වේ. ඒ අනුව, කමිටුව විසින් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 260 ම 2022 සැප්තැම්බර් මස සිට සමාලෝචනය කර පවතින අර්බුදකාරී ආර්ථික තත්ත්වය තුළ මතුවිය හැකි දුෂ්කරතාවයන් සැලකිල්ලට ගනිමින් පහත සඳහන් නිර්ණායකයන් මත පදනම් ව එම ව්‍යාපෘතිවල ඉදිරි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සාමූහික තීරණයන්ට එළඹෙන ලදී.

- ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 80% ට වඩා වැඩි නම් එම ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව.

- ආර්ථිකයට ධනාත්මක බලපෑමක් කළහැකි හා කඩිනමින් ප්‍රතිලාභ අත්කර දියහැකි ප්‍රමුඛ ව්‍යාපෘති.
- ව්‍යාපෘතියෙහි එක් එක් ක්‍රියාකාරකම් අත් කරගෙන ඇති ප්‍රගතිය සහ ව්‍යාපෘතිය නිම කිරීමට එහි ඇති සම්බන්ධය.
- අර්ධ වශයෙන් සිදු කර ඇති ක්‍රියාකාරකම්/ව්‍යාපෘති නිම නොකර ආරක්ෂිත පියවර හා විධිවිධාන යොදා ගනිමින් නතර කිරීමට ඇති අවකාශය මෙන් ම ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙන තුරු මහජනතාවට අවහිරතාවක් ඇති නොවන පරිදි අවම පිරිවැයක් යටතේ පවත්වාගෙන යාමට ඇති හැකියාව.
- ව්‍යාපෘති සඳහා ණය අරමුදල් සැපයීම සම්බන්ධව වර්තමාන තත්ත්වය හා ණය කොන්දේසි.
- මෙතෙක් දරා ඇති ආයෝජන වටිනාකම, ඉදිරි අක්මුදල් අවශ්‍යතාවය සහ ලබාදිය යුතු ප්‍රතිපාර්ශවීය අරමුදල් ප්‍රමාණය.
- ඉදිරි ක්‍රියාකාරකම්වලට අවශ්‍ය ඉන්ධන ඇතුළු ආනයනික අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සහ සැපයුම් සීමාවන්.
- විදේශ විනිමය අවශ්‍යවන කොන්ත්‍රාත් බැඳීම් සහ දේශීය කොන්ත්‍රාත් ගැටළු.
- තෙවන පාර්ශවීය එකඟතාවයන් හා බැඳුණු ගැටළු.

කමිටුව විසින් ගනු ලැබූ තීරණ මේ වන විටත් ඒ ඒ අමාත්‍යාංශ ලේකම්වරු වෙත දන්වා යවා ඇති අතර ඒවායෙහි ක්‍රියාත්මකවීම පිළිබඳව පසුවිපරම් සිදු කෙරෙමින් පවතී.